A

# නිවේදනය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණයේ දී අභියෝගයට ලක් වූ **"කොළඹ වරාය නගර ආර්ථික කොමිසම"** නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි.

**"කොළඹ වරාය නගර ආර්ථික කොමිසම"** නමැති පනත් කෙටුම්පතේ ව්‍යවස්ථානුකූලභාවය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය පහත සඳහන් පරිදි වේ:-

(i) **පනත් කෙටුම්පතේ 3(6), 30(3) දෙවැනි අතුරු විධානය, 55(2) සහ 58(1) හි විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවට අනනුකූල වන අතර එම විධිවිධාන වලංගු ලෙස සම්මත කළ හැකි වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84(2) ව්‍යවස්ථාවෙහි විධිවිධාන සලසා ඇති පරිදි පාර්ලිමේන්තුවේ විශේෂ බහුතරයකින් සම්මත කිරීම මගින් පමණි.**

කෙසේවෙතත්, ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයෙහි සඳහන් පරිදි එම වගන්ති සංශෝධනය කරන්නේ නම් එම අනනුකූලතාවයන් ඉවත්ව යනු ඇත.

(ii) **පනත් කෙටුම්පතේ 3(5) අතුරු විධානය, 3(7), 6(1)(ආ), 30(3) පළමුවැනි අතුරු විධානය, 71(1) සහ 74 [අර්ථ නිරූපණය "නියාමන අධිකාරිය"] ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවට අනනුකූල වන අතර එම විධිවිධාන වලංගු ලෙස සම්මත කළ හැකි වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84(2) ව්‍යවස්ථාවෙහි විධිවිධාන සලසා ඇති පරිදි පාර්ලිමේන්තුවේ විශේෂ බහුතරයකින් සම්මත කිරීම මගින් පමණි.**

කෙසේවෙතත්, ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයෙහි සඳහන් කර ඇති පරිදි එම වගන්ති සංශෝධනය කරන්නේ නම් එම අනනුකූලතාවයන් ඉවත්ව යනු ඇත.

(iii) **පනත් කෙටුම්පතේ 3(4), 6(1)(ද), 68(1)(ඊ) සහ 68(3)(අ) වගන්තිවල විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 සහ 4ව්‍යවස්ථා සමඟ කියවිය යුතු 76 ව්‍යවස්ථාවට අනනුකූල වන අතර එම විධිවිධාන වලංගු ලෙස සම්මත කළ හැකි වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84(2) ව්‍යවස්ථාවෙහි විධිවිධාන සලසා ඇති පරිදි පාර්ලිමේන්තුවේ විශේෂ බහුතරයකින් සම්මත කිරීම මගින් සහ 83 ව්‍යවස්ථාව ප්‍රකාරව ජනමත විචාරණයකදී ජනතාව විසින් අනුමත කිරීම මගින් පමණි.**

කෙසේවෙතත්, ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයෙහි සඳහන් කර ඇති පරිදි එම වගන්ති සංශෝධනය කරන්නේ නම් එම අනනුකූලතාවයන් ඉවත්ව යනු ඇත.

(iv) **පනත් කෙටුම්පතේ 52(5) සහ 71(2)(ජ) වගන්ති සමඟ කියවිය යුතු 52(3) වගන්තියේ විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3, 4 සහ 76 ව්‍යවස්ථා සමඟ කියවිය යුතු 148 ව්‍යවස්ථාවට අනනුකූල වන අතර එම විධිවිධාන වලංගු ලෙස සම්මත කළ හැකි වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84(2) ව්‍යවස්ථාවෙහි විධිවිධාන සලසා ඇති පරිදි පාර්ලිමේන්තුවේ විශේෂ බහුතරයකින් සම්මත කිරීම මගින් සහ 83 ව්‍යවස්ථාව ප්‍රකාරව ජනමත විචාරණයකදී ජනතාව විසින් අනුමත කිරීම මගින් පමණි.**

කෙසේවෙතත්, ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයෙහි සඳහන් කර ඇති පරිදි එම වගන්ති සංශෝධනය කරන්නේ නම් එම අනනුකූලතාවයන් ඉවත්ව යනු ඇත.

(v) **පනත් කෙටුම්පතේ 30(1), 33(1), 40(2) සහ 71(2)(ඕ) වගන්තිවල විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(ඌ) ව්‍යවස්ථාවට අනනුකූල වන අතර එම විධිවිධාන වලංගු ලෙස සම්මත කළ හැකි වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84(2) ව්‍යවස්ථාවෙහි විධිවිධාන සලසා ඇති පරිදි පාර්ලිමේන්තුවේ විශේෂ බහුතරයකින් සම්මත කිරීම මගින් පමණි.**

කෙසේවෙතත්, ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයෙහි සඳහන් කර ඇති පරිදි එම වගන්ති සංශෝධනය කරන්නේ නම් එම අනනුකූලතාවයන් ඉවත්ව යනු ඇත.

(vi) **පනත් කෙටුම්පතේ 53(3)(ආ) වගන්තිය සමඟ කියවිය යුතු 53(2)(ආ) වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 76 ව්‍යවස්ථාවට අනනුකූල වන අතර එම විධිවිධාන වලංගු ලෙස සම්මත කළ හැකි වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84(2) ව්‍යවස්ථාවෙහි විධිවිධාන සලසා ඇති පරිදි පාර්ලිමේන්තුවේ විශේෂ බහුතරයකින් සම්මත කිරීම මගින් සහ 83 ව්‍යවස්ථාව ප්‍රකාරව ජනමත විචාරණයකදී ජනතාව විසින් අනුමත කිරීම මගින් පමණි.**

කෙසේවෙතත්, ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයෙහි සඳහන් කර ඇති පරිදි එම වගන්ති සංශෝධනය කරන්නේ නම් එම අනනුකූලතාවයන් ඉවත්ව යනු ඇත.

(vii) **පනත් කෙටුම්පතේ 60(ඇ) සහ 60(ඊ) වගන්තිවල විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාවට අනනුකූල වන අතර එම විධිවිධාන වලංගු ලෙස සම්මත කළ හැකි වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84(2) ව්‍යවස්ථාවෙහි විධිවිධාන සලසා ඇති පරිදි පාර්ලිමේන්තුවේ විශේෂ බහුතරයකින් සම්මත කිරීම මගින් පමණි.**

කෙසේවෙතත්, ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයෙහි සඳහන් කර ඇති පරිදි එම වගන්ති සංශෝධනය කරන්නේ නම් එම අනනුකූලතාවයන් ඉවත්ව යනු ඇත.

(viii) **පනත් කෙටුම්පතේ 37 වැනි වගන්තියේ විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) සහ 14(1)(උ) ව්‍යවස්ථාවන්ට අනනුකූල වන අතර එම විධිවිධාන වලංගු ලෙස සම්මත කළ හැකි වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84(2) ව්‍යවස්ථාවෙහි විධිවිධාන සලසා ඇති පරිදි පාර්ලිමේන්තුවේ විශේෂ බහුතරයකින් සම්මත කිරීම මගින් පමණි.**

කෙසේවෙතත්, එකී බලයලත් තැනැත්තකු කොළඹ වරාය නගරයේ බල අධිකාරියට අයත් ප්‍රදේශයෙන් පිටත ව්‍යාපාර කටයුතුවල නිරත වන විට, එකී බල ප්‍රදේශයෙන් පිටත, එහෙත් ශ්‍රී ලංකාවේ භූමි භාගය ඇතුළත නිරත වන ඒ හා සමාන ව්‍යාපාරවලට හානියක් සිදුවන ආකාරයෙන් මෙම පනත් කෙටුම්පත යටතේ ලබාදී ඇති මොනයම් හෝ නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් භාවිතා කරනු ලැබීම වළක්වමින් 37 වැනි වගන්තියට අලුතින් උප වගන්තියක් එකතු කළහොත් එකී අනනුකූලතාවය ඉවත්වනු ඇත.

පනතේ ඉතිරි වගන්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල නොවන බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතුයැයි මම නියෝග කරමි.